# ජාතික ලොතරැයි මණ්ඩලය - 2010

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව ජාතික ලොතරැයි මණ්ඩලය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් , 2010 දෙසැම්බර් 31 දිනට ජාතික ලොතරැයි මණ්ඩලයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 1.2.1 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 දෙසැම්බර් 31 දින වන විට ණය ගැතියන් 12 දෙනෙකුගෙන් අයවිය යුතු රු.25,677,753 ක මුදලක් වර්ෂ 05 කට වඩා වැඩි කාලයක් ගත වී තිබුණි. එම මුදල් අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

(ආ) නියෝජිතයකුගෙන් අයවිය යුතු රු.545,926 ක මුදලක් අයකර ගත යුතුව තිබුණ ද අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

(ඇ) සෙවණ ලොතරැයි නියෝජිතයන් විසින් මණ්ඩලය වෙත නිකුත් කර තිබූ රු.1,490,445 ක් වටිනාකම වූ අගරු චෙක්පත් වලට අදාල මුදල් වර්ෂ 14 කට වැඩි කාලයක සිට අයකර ගත නොහැකි තත්ත්වයක පැවතුණි.

#### 1.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

රු. 293,504,383 ක් වූ ටිකට් මුද්‍රිත වියදම්, රු.144,286,796 ක් වූ ප්‍රචාරණ වියදම් හා ණයගැති එකතු වටිනාකම රු.34,734,079 ක් සම්බන්ධයෙන් ලිඛිත ගිවිසුම්, ටෙන්ඩර් ලියකියවිලි හා ශේෂ තහවුරු කිරීම් ආදී සාක්ෂි නොමැති වීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිලිගැනීමට නොහැකි විය. මෙම කරුණ සම්බන්ධයෙන් මණ්ඩලයේ සභාපතිගේ 2011 ජූනි මස 07 දිනැති ලිපිය මගින් මණ්ඩලයේ මුද්‍රණ කටයුතු, ප්‍රචාරණ කටයුතු හා ණයගැති පාලනය සම්බන්ධයෙන් වඩා යහපත් ක්‍රියා මාර්ග අනුගමනය කරමින් පවතින බව මා වෙත දන්වා තිබුණි.

### 1.2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| | --------------------------------- | ------------------ |
| (අ) | 1997 අංක 35 දරන පනත මගින් සංශෝධිත1963 අංක 11 දරන මුදල් පනතේ 20 වගන්තිය | 2008 අගෝස්තු 22 දින නීති කෙටුම්පත් සම්පාදක වෙත ඉදිරිපත් කරන ලද කෙටුම්පත් රීති වලට අනුකූලව අරමුදල් වෙන් කිරීම හා තැගි ව්‍යුහගත කිරීම සිදුකර තිබුණි. මෙම රීති අවශ්‍ය පරිදි මේ දක්වා ගැසට් පත්‍රයේ පළකර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 502 වැනි මුදල් රෙගුලාසියට අදාල 11 වැනි පරිශිෂ්ඨයේ 3 වැනි උපලේඛනය | මණ්ඩලය මගින් මුදල් රෙගුලාසිය ප්‍රකාර ස්ථාවර වත්කම් ලේඛන පවත්වාගෙන ගොස් නොතිබුණ. සත්‍යාපනය කරන ලද තොග ශේෂය ස්ථාවර වත්කම් ශේෂයට ගලපා නොතිබුණු අතර ඒ අනුව නැතිවීම්, අස්ථානගත වීම් හා වත්කම් වලින් සිදුවන පාඩු මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි. |
| (ඇ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9 පරිච්ඡේදයේ 9.7 ඡේදය | කාර්ය මණ්ඩලය වෙත ගෙවා තිබූ ප්‍රවාහන දීමනා සඳහා භාණ්ඩාගාරයේ අවශ්‍ය අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ඈ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 ඡේදය | මාර්ගෝපදේශ ප්‍රකාර වැඩ හා සේවාවන් සඳහා ලබා දිය යුතු උපරිම අත්තිකාරම් මුදල කොන්ත්‍රාත් මුදලින් 20% සීමාව ඉක්ම නොයා යුතු නමුත් අදාල සීමාව ඉක්මවා අත්තිකාරම් මුදල් ලබා දී තිබුණි. |

### 1.2.4 මතභේදයට තුඩුදෙන ගණුදෙණ

මණ්ඩලයේ සේවකයන්ගේ වෛද්‍ය බිල් ප්‍රතිපූර්ණය සඳහා රක්ෂණ සමාගමක් සමඟ පවත්වාගෙන ගොස් තිබූ රක්ෂණ යෝජනා ක්‍රමය වෙනුවට සමාලෝචිත වර්ෂයේ සිට මණ්ඩලයේ අරමුදලක් මගින් වෛද්‍ය බිල් ප්‍රතිපූර්ණය කිරීම ආරම්භ කර තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂය සඳහා රු.15,000,000 ක මුදලක් මූල්‍ය ප්‍රකාශනවල වියදමක් ලෙස සටහන් කර බැංකු ගිණුමක තැන්පත් කර එම තැන්පතුව යොදාගනිමින් ගෙවීම් කර තිබුණි.

මේ අනුව මණ්ඩලයේ අරමුදල් මණ්ඩලයේ මූල්‍ය පාලනයෙන් බැහැරව භාවිතා කිරීමේ හැකියාවක් ඇතිවී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට එම ගිණුමේ ඉතිරි වී තිබූ රු.3,986,916 ක ශේෂය ද මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. එබැවින් එම වටිනාකමින් අරමුදලේ වියදම් වැඩියෙන් හා මුදල් ශේෂය අඩුවෙන් දක්වා තිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය සමාලෝචනය

### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වලට අනුව, සමාලෝචිත වර්ෂය තුළදී මණ්ඩලයේ මෙහෙයුම් වලින් බදු වලට පසු රු.31,637,890 ක ශුද්ධ අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ශුද්ධ අතිරික්තය රු.45,512,371 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල වල රු.13,874,481 ක පිරිහීමක් දැක්වුණි. එම පිරිහීමේ ප්‍රතිශතය ඉකුත් වර්ෂයට සාපේක්ෂව 30.5% ක් විය.

ඉකුත් වර්ෂයට සාපේක්ෂව විකුණම් ආදායම වැඩි වී තිබූ නමුත් බදු ප්‍රතිපාදනය ඉකුත් වර්ෂයට වඩා රු.32,401,850 කින් වැඩි වීම මෙම මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට හේතු වී තිබුණි.

ඉකුත් වර්ෂය සඳහා රු.164,941,354 ක බදු ප්‍රතිපාදන සලසා තිබුණ නමුත් ගෙවා තිබූ තථ්‍ය බදු මුදල රු.198,991,306 ක් බැවින් ඌන බදු පතිපාදනය රු.34,049,952 ක් ගැලපීමෙන් පසු ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලන් හෙළිදරව් කර තිබූ රු.79,562,323 ක මූල්‍ය ප්‍රතිඵලය රු. 45,512,371 දක්වා අඩුවී තිබුණි.

## 2.1.2 <u>විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය</u>

(අ) ඉකුත් වර්ෂය සමග සසඳා බැලීමේදී පහත සඳහන් විෂයයන් වල වියදම් වැඩි වී තිබුණි.

| | | ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී වියදමේ වැඩිවීම රු. | ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී වැඩිවීමේ ප්‍රතිශතය % |
|---|---|---|---|
| (i) | පාර්තෝෂික | 21,668,831 | 271.37 |
| (ii) | මෝටර් රථ වාහන අලුත්වැඩියා හා නඩත්තු වියදම් | 3,837,049 | 47.29 |
| (iii) | උපදේශක හා වෘත්තීය ගාස්තු | 426,764 | 15.87 |
| (iv) | වාහන කුලී ගාස්තු | 2,730,057 | 197.07 |
| (v) | අලුත්වැඩියා හා නඩත්තු වියදම් | 4,753,298 | 177.81 |
| (vi) | පිරිසිදු කිරීම් හා නඩත්තු වියදම් | 781,575 | 71.33 |
| (vii) | කාර්යාල නවීකරණ වියදම් | 3,008,977 | 159.08 |
| (viii) | ප්‍රචාරණ වැඩසටහන් නිෂ්පාදනය හා විකාශන වියදම් | 30,476,570 | 39.94 |
| (ix) | ආයතනික ප්‍රතිරූප ප්‍රචාරණය | 43,265,994 | 47.17 |
| (x) | දුරකථන හා අන්තර්ජාල පහසුකම් වියදම් | 1,890,292 | 18.37 |
| (xi) | ටිකට් ප්‍රවාහන ගාස්තු | 863,962 | 24.65 |
| (xii) | මෝටර් වාහන ඉන්ධන වියදම් | 1,069,846 | 12.86 |

මණ්ඩලය ඉහත (i),(iv),(v),(vi) සහ (vii) යටතේ වියදම්වල අසාමාන්‍ය වර්ධනය සමාලෝචනය කර නොතිබුණු අතර එයට හේතු තහවුරු කරගෙන නොතිබුණි.

(ආ) ජාතික ලොතරැයි මණ්ඩලයේ ලොතරැයි අලෙවියට තරඟකාරී ආයතනයක් වන සංවර්ධන ලොතරැයි මණ්ඩලය වාර්ෂිකව ජනාධිපති අරමුදල හා වෙනත් ව්‍යවස්ථාපිත අරමුදල් වෙත පසුගිය වර්ෂ පහ තුල ප්‍රේෂණය කළ මුදල් හා එකී කාලය තුල ජාතික ලොතරැයි මණ්ඩලය ඒකාබද්ධ අරමුදල හා වෙනත් ව්‍යවස්ථාපිත අරමුදල් වෙත වාර්ෂිකව ප්‍රේෂණය කළ මුදල් සහ එම ප්‍රේෂණ අදාල ආයතන වල ලොතරැයිපත් විකුණුම් වල ප්‍රතිශතයක් ලෙස පහත දැක්වේ.

| වර්ෂය | ජාතික ලොතරැයි මණ්ඩලය | | | සංවර්ධන ලොතරැයි මණ්ඩලය | | |
|---|---|---|---|---|---|---|
| | ලොතරැයිපත විකුණුම් වලින් ලැබුණු ආදායම | ඒකාබද්ධ අරමුදල හා වෙනත් ව්‍යවස්ථාපිත අරමුදල් වෙත ප්‍රේෂණය කළ මුදල | ඒකාබද්ධ අරමුදල හා වෙනත් ව්‍යවස්ථාපිත අරමුදල් වෙත ප්‍රේෂණය කළ මුදල විකුණුම්වල ප්‍රතිශතයක් ලෙස | ලොතරැයිපත් විකුණුම් වලින් ලැබුණු ආදායම | ජනාධිපති අරමුදල හා වෙනත් ව්‍යවස්ථාපිත අරමුදල් වෙත ප්‍රේෂණය කළ මුදල | ජනාධිපති අරමුදල හා වෙනත් ව්‍යවස්ථාපිත අරමුදල් වෙත ප්‍රේෂණය කළ මුදල විකුණුම්වල ප්‍රතිශතයක් ලෙස |
| | රු. | රු. | | රු. | රු. | |
| 2006 | 6,166,031,736 | 967,282,580 | 15.69 | 3,761,749,339 | 942,467,000 | 25.05 |
| 2007 | 5,799,100,996 | 767,590,790 | 13.24 | 3,947,213,671 | 845,327,000 | 21.42 |
| 2008 | 6,534,404,643 | 898,282,571 | 13.75 | 4,259,779,178 | 655,883,000 | 15.40 |
| 2009 | 8,123,312,024 | 1,136,298,465 | 13.99 | 4,886,477,659 | 735,001,000 | 15.04 |
| 2010 | 8,360,978,554 | 1,189,460,051 | 14.22 | 5,266,907,459 | 888,511,000 | 16.87 |

ඉහත ලේඛනය අනුව ලොතරැයිපත් විකුණුම් වලින් ජාතික ලොතරැයි මණඩලය විසින් ඒකාබද්ධ අරමුදල හා වෙනත් ව්‍යවස්ථාපිත අරමුදල් වෙත කර තිබුණු ප්‍රේෂණයන්ට වඩා වැඩි ප්‍රතිශතයක් සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් ජනාධිපති අරමුදල හා වෙනත් ව්‍යවස්ථාපිත අරමුදල් වෙත ප්‍රේෂණය කර තිබුණි.

ඒකාබද්ධ අරමුදල වෙත මණ්ඩලය මගින් කර තිබූ අවම දායකත්වය හා දායක මුදල් වල ක්‍රමික පිරිහීම පිළිබඳව මණ්ඩලයේ වියදම් ව්‍යුහයේ කඩිනම් සමාලෝචනයක් සිදු කල යුතු බව විගණනයේදී අවධාරණය කෙරුණි.

(ඇ) <u>අනුපාත සහ ප්‍රතිශතයන්</u>

ලබාගත හැකි තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයෙ හා ඉකුත් වර්ෂයේ මණ්ඩලයේ මෙහෙයුම් වලට අදාල වැදගත් අනුපාත කිහිපයක් පහත දැක්වේ.

| | | 2010 | 2009 |
|---|---|---|---|
| | | % | % |
| (i) | ලාභදායිත්ව අනුපාත | | |
| i. | ශුද්ධ ලාභ අනුපාතය | 2.96 | 2.85 |
| ii. | ස්කන්ධය මත ප්‍රතිලාභ | 1.99 | 2.90 |
| iii. | සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ | 1.19 | 1.58 |
| (ii) | ප්‍රාග්ධන ප්‍රමාණාත්මකභාවය | | |
| i. | ස්කන්ධ / මුළු වත්කම් | 0.59 | 0.63 |
| ii. | ස්කන්ධ / ජංගම නොවන වගකීම් | 20.35 | 39.60 |
| (iii) | ද්‍රවශීල වත්කම් | | |
| i. | ජංගම වත්කම් අනුපාතය | 2.23 | 2.35 |
| ii. | ද්‍රවශීල වත්කම් අනුපාතය | 2.16 | 2.28 |

## 2.2 මෙහෙයුම් සමාලෝචනය

### 2.2.1 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රචාරණ ද්‍රව්‍ය තොගය ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබූ රු. 777,776 ක් වටිනා තොගයට අයත් රු.99,325 ක් වටිනා ජ්.අයි.නල භෞතිකව තොගය තුල නොතිබුණු අතර පාඩුව විමර්ශනය කර නොතිබුණි. රු.678,451 ක් වටිනා රන් කාසි තොගය ප්‍රචාරණ කටයුතු සඳහා යොදා නොගෙන වර්ෂ 5 කට පමණ වැඩි කාලයක සිට ගබඩාවේ තිබූ අතර ඒවායෙ වෙළඳපොල අගය ද ගිණුම්වලට ගලපා නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල රු.77,000 ක් ලෙස දැක්වුණ පරිගණක තොග වටිනාකමෙහි 2003 ජනවාරි 23 දින රු.3,750 බැගින් වූ මිලකට මිලදී ගෙන තිබූ භාවිතා කල නොහැකි පරිගණක මුද්‍රණ යන්ත්‍ර 6 ක වටිනාකම හා වාරික ගෙවීම පැහැර හැරි නියෝජිතයකුගෙන් ආපසු ලබාගත් පරිගණකයක රු.54,500 ක් වූ වටිනාකම ද ඇතුලත් කර තිබුණි. එම පරිගණකය

භෞතිකව තොගයේ නොතිබුණු අතර මණ්ඩලයට ආපසු ලැබුණු බවට ද කිසිදු සාක්ෂියක් නොවීය. එසේම පාඩුව පිළිබඳ විමර්ශනය කර නොතිබුණි.

(ඈ) 2009 වර්ෂයේදී එකක රු.341,340 බැගින් රු.2,048,040 ක් ගෙවා මිලදී ගෙන තිබූ ත්‍රී රෝද රථ 6 ක් පාවිච්චි කළ නොහැකි තත්ත්වයේ විය. අකාලයේ ක්‍රියා විරහිත වීමට හේතු සම්බන්ධව විමර්ශනය කිරීම සඳහා මණ්ඩලය මගින් කටයුතු කර නොතිබුණි.

(ඈ) එකක් රු.99,000 බැගින් වූ රු.1,584,000 ක් වටිනා යතුරු පැදි 16 ක් හා එකක් රු.7,162 බැගින් රු.931,000 ක් වටිනාකම වූ පාපැදි 130 ක් ගබඩාවේ නිශ්ක්‍රීයව තිබුණි. එම මිලදී ගැනීම් වල අවශ්‍යතාවය හා ගබඩාවේ නිශ්ක්‍රීයව තබා ගැනීම පිළිබඳ විමර්ශනයක් සිදු කර නොතිබුණි.

(ඉ) එකක් රු.395 බැගින් මිලදී ගෙන තිබූ රු.3,675,080 ක් වටිනා නියෝජිත නිල ඇඳුම් තොගයක් 2008 වර්ෂයේ සිට බැහැර කිරීම සඳහා සුදුසු ක්‍රියා මාර්ගයක් ගැනීමකින් තොරව නිශ්ක්‍රීයව ගබඩාවේ තබා තිබුණි.

(උ) 2007 වර්ෂයේදී කොළඹ ගුවන් තොටුපල සුපිරි දිනුම් ඇදීම සඳහා මිලදී ගෙන තිබූ පිරිවැය 15,436,511 ක් වටිනාකම වූ බී.එම්.ඩබ්ලිව් වර්ගයේ මෝටර් රථයක් මෙම වාර්තාවේ දිනය දක්වාම නිශ්ක්‍රීයව තිබුණි. සෙවණ ලොතරැයියේ ත්‍යාග ප්‍රදානය සඳහා රු.1,249,000 ක් ගෙවා 2008 වර්ෂයේදී මිලදී ගෙන තිබූ මෝටර් රථයක් සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම නිශ්ක්‍රීයව තිබුණි. මෙය ඵලදායී නොවන මුදල් උපයෝජනයේ ප්‍රතිඵලයකි.

2.2.2 <u>හඳුනාගන්නා ලද පාඩු</u>

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ සේවකයකු ලෙස කටයුතු කළ නියෝජිතයකුගෙන් අයවිය යුතු රු.1,538,785 ක් අයකර ගැනීම සඳහා පවරා තිබූ නඩුවක තීන්දුවට අනුව එම මුදල් ආපසු අයකරගත නොහැකි වී තිබුණි. එසේ වුවත් මෙම වටිනාකම මණ්ඩලයේ ණයගැතියන් යටතේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණ අතර ගිණුම් පොත්වල ප්‍රමාණවත් ප්‍රතිපාදනයක් සලසා නොතිබුණි.

(ආ) එකතුව රු.13,481,567 ක් වූ ණය ගැති ශේෂ හතරකට අදාල මුදල් සම්බන්ධයෙන් නොපමාව නීති ක්‍රියා මාර්ග නොගැනීම නිසා නැවත අයකර ගත නොහැකිව පැවතුණ අතර ගිණුම් වල අවශ්‍ය ප්‍රතිපාදනයන් සිදු නොකර ණය ගැතියන් යටතේ දක්වා තිබුණි.

### 2.2.3 මානව සම්පත් කළමනාකරණය

අනුමත කාර්ය මණ්ඩලය 262 ක් පමණක් වුවද මණ්ඩලය විසින් කාර්ය මණ්ඩලය 272 ක් සේවයේ යොදවා තිබුණි. 2010 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය සහ පුරප්පාඩු හා අතිරික්තතා තත්ත්වය පහත වගුවෙන් දැක්වේ.

| සේවක වර්ගය | අනුමත කාර්ය මණ්ඩලය | තථ්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු | අතිරික්තය |
|---|---|---|---|---|
| විධායක ශ්‍රේණි | 28 | 24 | 04 | - |
| විධායක නොවන ශ්‍රේණි | 234 | 227 | 07 | - |
| කොන්ත්‍රාත් පදනම | - | 20 | - | 20 |
| වෙනත් | - | 01 | - | 01 |
| එකතුව | 262 | 272 | 11 | 21 |

### 2.2.4 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත සහ තථ්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව දක්නට ලැබුණි.

## 3. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු, මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලද මාගේ විස්තරාත්මක විගණන වාර්තාව මගින් සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) ස්ථාවර වත්කම්
(ආ) ඉන්ධන වියදම්
(ඇ) පරිගණකගත තොරතුරු පද්ධතිය
(ඈ) ගබඩා වාර්තා
(ඉ) මිලදීගැනීම්